**කෝරලේපත්තු බටහිර ප්‍රාදේශීය සභාව - 2017**
**මඩකලපුව**
**-----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 11 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 13 දින සභාවේ සභාපතිවරයාට නිකුත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කෝරලේපත්තු බටහිර ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

සමාලෝචිත වර්ෂයට මුද්දර ගාස්තු රු. 567,800 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 ලැබිය යුතු දෑ**
**-----------------**

ස්ථාන මාරු වී ගිය, සේවය අත්හිටවූ සහ විශ්‍රාම ගිය සේවකයින් 06 දෙනෙකුට ලබාදී තිබූ ණය මුදලෙන් තවදුරටත් අයකර ගත යුතු රු 59,416ක මුදලක් 1998 වර්ෂයේ සිට හිඟ හිටව පැවති අතර ඒවා ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් හෝ විශ්‍රාමික පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**
**-----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබූ රු.35,936,292ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි සඳහා ඉඩම් හිමිකම් ඔප්පු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.4 නීති, රීති හා කළමණාකරන තීරණ ආදියට අනුකූල නොවීම**
**-------------------------------------------------------------**

විගණනයේදී නිරීක්ෂණය වූනීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විශ්ලේෂණය කර පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ)** 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති<br>I පරිච්ඡේදයේ5(XII)වගන්තිය | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් තැබීම් ආදිය නිලධාරීන් දෙදෙනෙකුට පරිපාලනමය වශයෙන් පවරා දී තිබුණත්, ඔවුන්ගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි. |
| **(ආ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| **(i)** මුදල් රෙගුලාසි 571 | 2009-2014 කාලපරිච්ඡේදය තුළ ලංසු තැන්පතු, කොන්ත්‍රාත් තැන්පතු සහ අනෙකුත් තැන්පතු වශයෙන් වූ රු.8,148,122ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව ආපසු ලබා දී නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1645 සහ 1646 | වාහනවලට අදාල සෑම මාසයකම ධාවන සටහන් සහ මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 වැනි දිනට ප්‍රථම විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, සභාව විසින් භාවිතා කරනු ලබන වාහනවල ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 6,811,723 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 899,694 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,912,029ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 2.2 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **උසාවි දඩ**

2013 වර්ෂයට පෙර පැවැති හිඟ හිට උසාවි දඩ ගාස්තු රු. 2,082,066ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **හිඟ කුලී**

**-----------**

2017 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාල හිඟ කුලී රු. 469,920ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **හිඟ බදු**

**-----------**

සමාලෝචිත වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාල හිඟ බදු රු. 62,166ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1 කාර්යසාධන සමාලෝචනය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තිරසාර සංවර්ධන අරමුණු

--------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මව් හා ළදරු සුභසාධනය සහ සෞභාග්‍ය පවත්වාගෙන යාම

-------------------------------------------------------------------

සභා බල ප්‍රදේශයේ ප්‍රදේශයක 2017 වර්ෂයේ ඉපදුණු ළදරුවන් 467 දෙනෙකුගෙන් ළදරුවන් 35 (7.5%) දෙනෙකු අඩු බර සහිතව ඉපදී තිබුණි. නමුත් සභාවේ අයවැය සැලැස්මේ රු.200,000 ක් මව් සහ ළදරු සුභසාධනය සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණත්, සභාව විසින් ඉහත සඳහන් සැලසුම සඳහා ප්‍රතිපාදන වැය කර නොතිබුණි. තවද, 2014, 2015 සහ 2016 වර්ෂවලදී ඉපදුණු ළදරුවන් පිළිවෙලින් 471, 391 ක් සහ 405 කගෙන් පිළිවෙලින් 36, 23 ක් සහ 32 ක් අඩු බර ළදරු උපත් වුවත්, සභාව විසින් අයවැය සැලැස්මේ ඉහත කරුණ සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබූ නමුත්, ඉහත සඳහන් සැලසුම සඳහා 2016 වර්ෂයේදී පමණක් රු.56,000 ක් වැයකර තිබුණි.

(ඇ) 1958 වර්ෂයේ අංක 29 දරන සත්ව පනත ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී ගවයින් මස් පිණිස ඝාතනය කිරීමේදී පනතේ විධිවිධානවලට අනුකූලව ගවයින් ඝාතනය කර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස පනතට පටහැනි අයුරින් ගවයින් ඝාතනය කිරීමේ අවස්ථා උදාවිය හැකිය.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**---------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාලච්චේනෙයි කඩදාසි කර්මාන්ත ශාලාවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලැබිය යුතු හිඟහිටි වරිපනම් බදු රු.11,937,904 ක් වුවත් එය අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) JCB යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේ පැය 222 ක් සභාවේ කාර්යයන් ඉටු රීමට අමතරව රු.2,321,550 ක ආදායමක් උපයා තිබූ නමුත් අලුත්වැඩියා වියදම් සඳහා රු.1,062,484 ක් ද, ඉන්ධන සඳහා රු.1,207,369 ක් ද, යන්ත්‍ර ක්‍රියාකරු හා අත් උදව්කරු වැටුප් සඳහා රු.700,000 ක්ද වශයෙන් එකතුව රු.3,224,860 ක් වැය වී තිබුණි. මෙම යන්ත්‍රය 2017 නොවැම්බර් මාසයේ සිට ක්‍රියාවිරහිත වී තිබූ අතර මේ දක්වා අලුත්වැඩියා කර නොතිබුණි.

(ඇ) Excavator මිලදී ගැනීම

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රු.10,950,000 ක වටිනාකමකට Excavatorයක් 2017 මාර්තු මාසයේ මිලදී ගැනීම සඳහා වැය කර තිබූ නමුත්, යන්ත්‍රය ක්‍රියා කරවීම සඳහා වූ මානව සම්පත් සභාව සතුව නොතිබුණි. මෙම යන්ත්‍රයේ ටයර්, chain ආකාරයෙන් පැවතීම නිසා මෙම වාහනය වෙනත් වාහනයක ආධාරයක් ඇතිව පමණක් චලනය කළ හැකි බව දැන සිටියත්, වියලි කාලගුණයක් සහිත ප්‍රදේශයක් වන මෙම ප්‍රදේශයට මෙම යන්ත්‍රය සුදුසු නොවන බවද දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ සභාවේ තිබෙන JCB යන්ත්‍රය මඟින් ආසන්න වශයෙන් රු.903,310 ක පාඩු සිදු වී තිබුණත් ඒ පිළිබඳ සැලකිලිමත් නොවී මෙම යන්ත්‍රය මිලදී ගෙන තිබුණි.

(ii) සෑම මාසයකම ණය සඳහා පොලී වශයෙන් රු.60,000 ක් ගෙවනු ලබන අතර 2017 අප්‍රේල් මාසයේ සිට 2018 මැයි මාසය දක්වා මාස 14 ක කාලපරිච්ඡේදයක් සඳහා ණය පොලී වශයෙන් පමණක් රු.840,000 ක් ගෙවා තිබුණු අතර මෙම කාල පරාසය සඳහා රු.340,000 ක් පමණක් ආදායම් ලෙස උපයාගෙන තිබුණි. ඒ අනුව මෙම කාලසීමාවට පමණක් රු.500,000 ක පාඩුවක් සිදු වී තිබූ අතර මෙම ආයෝජනය සඳහා යෙදවූ මුදල් වාර්ෂික 11% ක පොලියක් මත ඵලදායී ආයෝජනයක යෙදවීමෙන් මෙම මාස 14 ක කාලසීමාව සඳහා පාඩුවක් රහිතව රු.1,405,250 ක ආදායම් සභාවට උපයාගත හැකිව තිබුණි.

3.3 නිෂ්කාර්ය වත්කම්

--------------------

සභාවට අයත් රෝද හතරේ ට්‍රැක්ටරයක් 2010 වර්ෂයේ සිට භාවිතා නොකර සභා පරිශ්‍රයේ නවතා තිබූ නමුත් එය අලුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට හෝ කටයුතු කර නොතිබුණි.

3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

"යුනෝප්ස්" ආයතනයෙන් ඝන අපද්‍රව්‍යවලින් කාබනික පොහොර සෑදීමේ මධ්‍යස්ථානය 2016 වර්ෂයේ ස්ථාපිත කර තිබුණි. එම මධ්‍යස්ථානයට කසළ ප්‍රවාහනය සහ අනෙකුත් වියදම් වශයෙන් "යුනෝප්ස්" ආයතනයෙන් ලබා දී තිබූ රු.1,860,000 ක් සහ සභා අරමුදලින් රු.17,822,853 ක් වැය කර තිබූ නමුත් කාබනික පොහොර සැකසීමේ ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේ ඉදිරියට ගෙන ගොස් නොතිබුණි.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය
-------------------------------------

4.1 අයවැය පාලනය
---------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු කළ වියදම් සහ තථ්‍ය වියදම් අතර 43% සිට 113% දක්වා වෙනස්කම් නිරීක්ෂණය විය. මේ අනුව අයවැය ඵලදායී කළමනාකරණ පාලන සාධකයක් වශයෙන් භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලන**
**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| **පාලන ක්ෂේත්‍රය** | **විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන්** |
|---|---|
| (අ) ගිණුම් තැබීම | ලෙජර ගිණුම් දෛනිකව නිසි අයුරින් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) අයවැය පිළියෙල කිරීම | අයවැය පිළියෙල කිරීමේදි අදාල විෂයයන් විශ්ලේෂණය කිරීම හා සැලකිල්ලට ගැනීම. |
| (ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය | අපද්‍රව්‍ය ඉවත් කිරීම සම්බන්ධයෙන් නියමිත ආකාරයට සැලැසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |